

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය (1)

- භූමි ප්‍රමාණය: වර්ග කිලෝ මීටර 65,610 (හොක්කයිඩෝ හි විශාලත්වයෙන් 0.8 ගුණයක් පමණ)
- ජනගහනය මිලියන 22.16 (ශ්‍රී ලංකා මහ බැංකුව, 2021 වසර)
- ජන වාර්ගිකත්වය: සිංහල (74.9%), ද්‍රවිඩ (15.3%), ශ්‍රී ලාංකික මුස්ලිම් (9.3%)
- භාෂා: රාජ්‍ය භාෂාව (සිංහල, දෙමළ), සම්බන්ධීකරණ භාෂාව (ඉංග්‍රීසි)
- ආගම: බුද්ධාගම (70%), හින්දු ආගම (13%), ඉස්ලාම් (10%), ක්‍රිස්තියානි (8%)
- අපේක්ෂිත ආයු කාළය: පිරිමින් අවුරුදු 73 ක් සහ කාන්තාවන් අවුරුදු 80 ක් (ලෝක බැංකුව, 2020).
- වැඩිහිටි සාක්ෂරතා අනුපාතය: 92% (ලෝක බැංකුව, 2020)

ශ්‍රී ලාංකික සම්බන්ධිත ජපානයේ පදිංචිකරුවන්ගෙන් 11% ක් නේවාසික පදිංචියේ කාල සීමාවක් නොමැති ස්ථිර පදිංචිකරුවන් වන අතර, 27% ක් නිශ්චිත ක්ෂේත්‍රයන්හි නිපුණතා හෝ දැනුම අවශ්‍ය රැකියාවල නියුතු අයට ලබාගත හැකි, තාක්ෂණික, මානව ශාස්ත්‍ර හෝ ජාත්‍යන්තර සේවා කාණ්ඩයට අයත් වන අතර, 18% විදේශීය ජාතිකයෙකුගේ කලත්‍රයා හෝ දරුවෙකු යැපෙන්නෙකු ලෙස ලබා ගත හැකි පවුල් නේවාසික පදිංචි කාණ්ඩයට අයත් වන අතර, මෙය ජපානයේ වෙසෙන අයගෙන් බහුතරය වේ. (සංඛ්‍යාලේඛන කාර්යාංශය, අභ්‍යන්තර කටයුතු සහ සන්නිවේදන අමාත්‍යාංශය, ජූනි 2022 ජූනි).

### පාසල් පද්ධතිය සහ ලබා ගත හැකි සුදුසුකම්/උපාධි

- ශ්‍රී ලංකාවේ අනිවාර්ය අධ්‍යාපනයේ කාලසීමාව වසර 11 ක් වන අතර එය මුළු, ප්‍රාථමික සිට ද්විතියික පාසල දක්වා කාලය වේ
- 2018 වර්ෂයේ, ශුද්ධ බඳවාගැනීම් අනුපාතය ප්‍රාථමික අධ්‍යාපනය සඳහා 99.46% (1-5 ශ්‍රේණි), පහල ද්විතීයික අධ්‍යාපනය සඳහා 99.87% (6-9 ශ්‍රේණි) සහ 84.21% ඉහල ද්විතීයික අධ්‍යාපනය සඳහා (10-11 ශ්‍රේණි) (UIS, 2022).
- අධ්‍යාපනික දින දර්ශනය ජනවාරි සිට දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක වේ.

| | | | |
|---|---|---|---|
| | පූර්ව රැකියා අධ්‍යාපනික ආයතන | | |
| අනිවාර්ය අධ්‍යාපනය | ප්‍රාථමික පාසල (ප්‍රාථමික පාසල) | 1 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 5-6) | |
| | | 2 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 6-7) | |
| | | 3 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 7-8) | |
| | | 4 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 8-9) | |
| | | 5 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 9-10) | ★ ප්‍රාථමික පාසල් අධ්‍යාපනය අවසන් කිරීමේ සහතිකය |
| | පහළ ද්විතියික පාසල (ද්විතීයික පාසල) | 6 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 10-11) | |
| | | 7 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 11-12) | |
| | | 8 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 12-13) | |
| | | 9 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 13-14) | ★ පහළ ද්විතියික පාසල් අධ්‍යාපනය අවසන් කිරීමේ සහතිකය |
| | ඉහළ ද්විතියික පාසල (උසස් පාසල) | 10 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 14-15) | |
| | | 11 වන ශ්‍රේණි ශිෂ්‍ය (අවුරුදු 15-16) | ★අපොස-සාමාන්‍ය පෙල |
| | කාර්මික විද්‍යාලය, Collegiate | | ★අපොස-උසස් පෙල (විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම්) |
| | විශ්ව විද්‍යාලය | | ★ ඩිප්ලෝමාව ★ ආශ්‍රිත උපාධිය ★ ශාස්ත්‍රවේදී උපාධිය ★ ශාස්ත්‍රපති උපාධිය ★ ආචාර්ය උපාධිය |

ප්‍රාථමික අධ්‍යාපනය ජපානයට වඩා වසරක් කෙටි වන අතර පහල ද්විතීයික අධ්‍යාපනයේ වාරය වසරක් දිගු වේ.

පාසලට ඇතුලත් කිරීමේ වයස ජපානයට වඩා වසරකට පෙර වන අවුරුදු 5 වේ.

### පාසල් ඇතුළත් කිරීමේ ක්‍රම වේදය සහ පාසල් කලාප නම් කිරීම

- දෙමාපියන් තම දරුවන් පාසල් යැවීමටනිළ වශයෙන් බැඳී සිටී.
- සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන පාසල් ආසන්න වශයෙන් 11,000 වන අතර එයින් 97% ක් රජයේ පාසල් වේ (20% ජාතික සහ 80% පලාත් සභා). බොහෝ ප්‍රාථමික කණිෂ්ඨ හා උසස් පාසැල් ඒකාබද්ධ කොට ඇත (60% පමණ).
- පාසල් ප්‍රාදේශකය නාමිකව තීරණය කර නොමැති වුවද, සාමාන්‍යයෙන්, සිසුන් තම නිවසට ආසන්නතම පොදු පාසලට ඇතුළත් කරනු ඇත. කෙසේ වෙතත්, දෙමව්පියන් හෝ සහෝදර සහෝදරියන් ඉගෙනුම ලැබූ පාසැලක් වේනම් එයට ඇතුළත් කිරීමට අවකාශ ඇත.
- දරුවා පාසලට ඇතුළත් කිරීම පිණිස වන ක්‍රියා පටිපටිය නම්, දරුවා වයස අවුරුදු පහ සම්පූර්ණ වී ඇති බවට සනාථ කරන පදිංචි සහතිකයක් පාසලට ඉදිරිපත් කිරීම වේ.

### පාසල් අධ්‍යාපන වියදම්

- ප්‍රාථමික පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා ඇති රජයේ පාසල්, නොමිලේ සිදු කරනු ලබයි. පෙළපොත් නොමිලේ ලබා දෙන අතරම, සෑම වසරකම නිල ඇඳුමක් සඳහා රෙදි ලබාදීමද සිදු කරනු ලබයි. පාසල් භාවිතය සඳහා වන සැපයුම් දෙමාපියන් විසින්ම දැරිය යුතු වේ.

### වැඩි දුර අධ්‍යාපන අවශ්‍යතා

- පහළ ද්විතියික පාසල: ප්‍රාථමික පාසල අවසන් කිරීම
- ඉහල කණිෂ්ඨ පාසල ද්විතියික පාසල: පහළ ද්වතීයික පාසල අවසන්
- Collegiate: අ.පො.ස. සා.පෙළ. ප්‍රධාන විෂයයන් අතුරින් ගණිතය සහ පළමු භාෂාව ඇතුළුව ප්‍රධාන විෂයයන් තුනකින් සමත්වීම
- විශ්ව විද්‍යාල: අ.පො.ස. උසස් පෙළ. ගණිතය සහ පළමු භාෂාව ඇතුළුව ප්‍රධාන විෂයයන් තුනකින් සමත් වීම

අ.පො.ස. (අධ්‍යාපන පොදු සහතිකය) යනු, එක්සත් රාජධානියේ සහ එහි පැරණි යටත් විජිත ආදියෙහි පවත්වනු ලබන විභාගයක් වන අතර, එය උසස් පෙල පාසැල් සමත් වීමේ මට්ටම සහ (සාමාන්‍ය) පෙල සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාග (උසස්), පෙල සඳහා අවශ්‍ය මට්ටම, වේ. ශ්‍රී ලංකාවේ, උසස් ද්විතීයික පාසලෙන් (11 ශ්‍රේණියේ) සමත් වීමෙන් පසුව සාමාන්‍ය පෙල විභාග වලට පෙනී සිටින අතර, එයින් ඔවුන් සමත් වුවහොත්, ඔවුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශයසඳහා සූදානම් වීමේ පාඨමාලා වන කොලෙජියට් පාඨමාලා සඳහා ඇතුළත් විය හැකිය. අදාල පාසල අවසන් වූ පසු. උසස් පෙල විභාග පෙනී සිටින අතර, ඔවුන් එයින් සමත් වුවහොත්, උසස් අධ්‍යාපනය පිණිස විශ්ව විද්‍යාලයට යා හැක. සෑම විශ්ව විද්‍යාලයක්ම එහි ලකුණු මට්ටම අනුව තෝරා ගනු ලැබේ.

©2024 Japan International Cooperation Agency. All Rights Reserved

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය (2)

## ආබාධ සහිත දරුවන්ගේ පාසල් පැමිණීම

*(විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය) සහ (විශේෂ පන්ති කාමර) ක්‍රමවේදය පිළිබඳ අර්ථ දැක්වීම් රටින් රටට වෙනස් වේ. වැඩි විස්තර සඳහා ජාතික අධ්‍යාපන පද්ධති සමීක්ෂණය භාවිතා කිරීම සඳහා වන මාර්ගෝපදේශය බලන්න.

ශ්‍රී ලංකාව තුළ, 2003 දී (ආබාධිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය) ඇතුළත් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සකස් කරන ලදී.

2013 දී "අධ්‍යාපනය ප්‍රථම ප්‍රතිපත්තිය" අනුව "විශේෂ අවශ්‍යතා" සහිත දරුවන් ද සාමාන්‍ය පන්තිවල අධ්‍යාපනය පිණිස දිරිමත් කර ඇති අතර, "2018-25 අධ්‍යාපන සංවර්ධන සැලැස්ම" මගින් 2025 වන විට Inclusive අධ්‍යාපනය සියලුම සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලා තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරෙන අතර, ආබාධ සහිත දරුවන් සඳහා පරිසරයක් නිර්මාණය කරමින් ඉදිරියට යන බව  ප්‍රකාශණ සැලැස්මේ සඳහන් කොට ඇත. විශේෂ අවශ්‍යතා සහිත හඳුනාගත් දරුවන් වෙනුවෙන්, තනි පුද්ගල අධ්‍යාපන සැලසුමක් නිර්මාණය කිරීමටත්, එම සැලැස්ම පදනම් කොට, ඔවුන්ගේ පුද්ගල අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යාපනය ලබා දීමටත් නියමිතය.

ඒ කෙසේ වුවද, UNICEF (2021) ට අනුව, අයවැය හිඟය, ප්‍රමාණවත් පහසුකම් සහ උපකරණ නොමැතිකම සහ විශේෂිත පුහුණුව ලත් ගුරුවරුන් හිඟතාවය නිසා, ආබාධ සහිත දරුවන් සඳහා පාසල් අධ්‍යාපන අවස්ථා ලබා දීම ප්‍රමාණවත් නොවන බව පෙන්වා දී ඇත.

- **පාසල් ඇතුළත් කිරීමේ ක්‍රියා පටිපාටි**

(1) ආබාධ සහිත දරුවන්ට තම අවශ්‍යතාවලට ගැලපෙන අධ්‍යාපනයක් ලැබීමට අවශ්‍ය වූ විටක, දරුවන් තම වයස අවුරුදු තුන සම්පූර්ණ කල පසු, සෑම පලාත් ආයතනයකම ස්ථාන ගත කර ඇති ඇගයීම් මධ්‍යස්ථානයකදී වර්ධන ඇගයීමකට භාජනය විය යුතුය.

(2) වර්ධන ඇගයීමේ ප්රතිඵල අනුව, දෙමාපියන්ගේ කැමැත්ත පරිදි, ඇතුලත් කිරීමේ පාසැල තීරණය කරනු ලැබේ.

- **ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපන ස්ථානයන්**

**සාමාන්‍ය පාසල්**

සාමාන්‍ය පාසල් ආබාධ සහිත දරුවන් සාමාන්‍ය පාසල් පන්තිවලදී ආබාධිත නොවන දරුවන් සමඟ එකට ඉගෙන ගනී.

**විශේෂ අධ්‍යාපන ඒකකය (Special Education Unit)**

මෙය ජපානයේ විශේෂ අවශ්‍යතා පන්තියකට සමාන පන්තියක් වන අතර, පන්ති කාමර 704 ක් පිහිටුවා ඇත. (2016 වර්ෂයය)

**විශේෂිත පාසැල් (Special School)**

විශේෂ අධ්‍යාපන ජපානයේ විශේෂ අවශ්‍යතා සහිත පාසලකට සමාන පාසලක,අන්ධ, බිහිරි, සහ බුද්ධිමය ආබාධ සහිත වැනි ළමුන් සඳහා විශේෂිත පාසල් වැනි පාසල් 29 කි (2019 වර්ෂය)

ඔටිසම් සහිත දරුවන් වෙනුවෙන් ඔටිසම් දාරක ජාතික විශේෂ මධ්‍යස්ථානයක් ඇත එසේම, බරපතල ආබාධ සහිත දරුවන්ට, නිවෙස් වල හා ප්‍රජා මධ්‍යස්ථාන වලදී අධ්‍යනය ලැබීමේ හැකියාවද ඇත.

**ඉගැන්වීම් මාර්ගෝපදේශයේ මතක තබා ගත යුතු කරුණු**

- ඔටිසම් සහ ADHD වැනි"සංවර්ධන ආබාධ" වැනි සාපේක්ෂිත නව සංකල්පය සම්බන්ධයෙන්, දෙමාපියන්ට පූර්ණ අවබෝධයක් නොමැති අතර, එසේම එය ආබාධිතය යන හැඟීමක්ද නොමැත.
- ජපානයට පැමිණීමට පෙර දරුවාගේ අධ්‍යාපනයේ තත්ත්වය, පවුල් පරිසරය සහ වැඩීම් හා වර්ධන ඉතිහාසය, මෙන්ම මව් භාෂාවේ වර්ධනයේ තත්ත්වය ද දරුවාගේ වර්ධනයට බලපාන බව බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

©2024 Japan International Cooperation Agency. All Rights Reserved

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අන්තර්ගතය (1)

- විෂයමාලා රාමුව සංශෝධනය කොට, 2023 වර්ෂයේ සිට නව විෂය මාලාව ක්‍රමානුකූලව හඳුන්වා දී ඇත. මෙම සංශෝධනය මගින් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයේ සිට ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කරන ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනයට මාරුවීමක් සනිටුහන් කර ඇත.
- ඉගෙනුම් මාධයය ප්‍රධාන වශයෙන් සිංහල හෝ දෙමළ (සිංහල) 73.3%, දෙමළ 24.2%, වෙනත් 2.5% ලෙස වේ.

## විෂය (ප්‍රාථමික/ද්විතීයිකපාසල)

- නව විෂය මාලාවට අනුව ප්‍රාථමික පාසලේ (1-5 ශ්‍රේණි),වන අතර 9 ක් වන විෂයයන් ඉගෙනු ලබන ලබයි (මව් භාෂාව, ඉංග්‍රීසි, දෙවන මව් භාෂාව, ගණිතය, මූලික විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, ආගම සහ සාරධර්ම අධ්‍යාපනය, ඒකාබද්ධ කලා අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය සහ බාහිර විෂයක්‍රියාකාරකම්)
- ඉංග්‍රීසි භාෂාව, සිංහල සහ දෙමළ භාෂා අතර සම්බධිත භාෂාව ලෙස සලකනු ලැබේ. ප්‍රාථමික පාසලේ පළමු ශ්‍රේණියේ සිට ඉංග්‍රීසි පළමු විදේශීය භාෂාව (අනිවාර්‍ය) ලෙස ඉගෙනුම ලබයි.
- නව විෂය මාලාවට අනුව, ද්විතීයික පාසලේ (6-9 ශ්‍රේණිවල) අධ්‍යයන විෂය මාලාව මූලික විෂයයන්, තේරීම් විෂයයන් ලෙස සහ බාහිර විෂය ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. මූලික විෂයයන් ලෙස වන්නේ: මව් භාෂාව, ඉංග්‍රීසි, දෙවන මව් භාෂාව, ගණිතය, විද්‍යාව, ආගම සහ සාරධර්ම අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණය, භූගෝල විද්‍යාව සහ ජාත්‍යන්තර අධ්‍යයන, ඉතිහාසය, සිවිල් අධ්‍යාපනය, වාණිජ හා ව්‍යවසායකත්ව අධ්‍යාපනය, කලාව සහ තාක්ෂණය. බාහිර විෂය,ක්‍රියාකාරකම්වලට ක්‍රීඩා, සමාජ ක්‍රියාකාරකම් (උදා: ශිෂ්‍ය භටයින් (කැඩෙට් සඳහා තරුණ සංවිධානයක්), තරුණ රතු කුරුස, සහ ශාන්ත ජෝන් ගිලන් රථ) යනාදී සමිති/සමාගම් ඇතුළත් වේ.
- ද්විතීයික පාසල්වල, ගණිතය ඇතුළුව විද්‍යාව ඉංග්‍රීසි භාෂාවෙන් උගන්වනු ලැබේ.

## ඇගයීම් සහ උසස්වීම් පද්ධතිය

- ශ්‍රී ලංකා රජය, සම්පිණ්ඩන ඇගැයුම සිට ආකෘතිකමය ඇගයීම් කරණයක් සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කරන ලදී.
- නව විෂයමාලා රාමුව තුළ, ප්‍රාථමික පාසැල් වල 1 - 3 පළමු ශ්‍රේණියේ සිට තුන්වන ශ්‍රේණි දක්වා වන සිසුන් වෙනුවෙන් ඉගෙනීම ඇගයීම සිදු කරනු ලබන්නේ ආකෘතික ඇගයීම් හරහා පමණක් වන අතර නියාමිත කාලීන විභාග නොමැත. ප්‍රාථමික පාසල් වල 4 - 5 ස් වන ශ්‍රේණි සිසුන් සඳහා 50% ආකෘතික ඇගැයුමකින්, සහ 50% සම්පිණ්ඩන ඇගැයුමකින් තක්සේරු කරනු ලබයි.
- පුණරාවර්තන ක්‍රම වේදයක්ද ඇත. අවශ්‍ය වන්නා වූ අවම සම්මානිත්වය නොලබන විට, එම අධ්‍යන වර්ෂය සම්පූර්ණ කළ නොහැක. අනෙක් අතට, ඉගෙනුම් වේගය ඉහල ශිෂ්‍ය දරුවන් හට, ඉක්මනින් ජාතික විභාග(අපොස-සාමාන්‍යපෙල හා අපොස-උසස් පෙල) පිණිස පෙනී සිටීමට අදාල අවශ්‍යතාවයන් සපුරා ඇ.ත්.

- 1 - 11 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපන ප්‍රවර්ධනය ඉහල අනුපාතයකින් තිබුනද, ඉහල ද්විතීයික අධයාපනය අවසානයේදී (11 වන ශ්‍රේණි සිසුන්ගේ දෙසැම්බර්) පවත්වන ජාතික විභාගය` (අපොස-සාමාන්‍ය පෙල) සමත් නොවුවහොත්, උසස් පෙල අධ්‍යනය පිණිස යාමට නොහැක. (2021 වර්ෂයේ අපොස-සාමාානය පෙල සමත් වීමේ අනුපාතය 75%)
- ප්‍රාථමික අධ්‍යාපනය අවසන් අධ්‍යන වසරෙහි රැඳී සිටිමේ අනුපාතය (*) වනුයේ 99%(ලෝක බැංකුව 2019 වර්ෂය).

(*) ප්‍රාථමික අධ්‍යාපන පළමු ශ්‍රේණියට ඇතුළත් වූ දරුවන් අතරින් අවසන් අධ්‍යන වර්ෂය දක්වා ළඟා වීමේ ප්‍රතිශතය.

අවසන් කිරීමේ ප්‍රතිශතය (*): ප්‍රාථමික අධ්‍යාපනය 99% ද්විතීය අධයාපනය 95%、 ඉහල ද්විතීයික38% (2016 වර්ෂය)

(*)අවසාන අධ්‍යන වර්ෂය සම්පූර්ණ කළ එක් එක් අධ්‍යාපනික අදියරෙහි අවසාන ශ්‍රේණිය සඳහා අදාළ වයසට වඩා අවුරුදු 3-5ක් වැඩිමල් දරුවන්ගේ ප්‍රතිශතය (UNICEF, දත්ත, 2022 වර්ෂය).

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අන්තර්ගතය (2): ගණිත විෂය මාලාව

## ප්‍රාථමික ගණිත අධ්‍යාපනය සඳහා ඉගෙනුම් අන්තර්ගත පද්ධති ලැයිස්තුව (ජපන් ඉගෙනුම් ක්ෂේත්‍ර අනුව සංවිධානය කර ඇත)

| ක්ෂේත්‍රය/ශ්රේණිය* | පළමු ශ්‍රේණිය | දෙවන ශ්‍රේණිය | තුන්වන ශ්රේණිය | හතර වන ශ්රේණිය | පස්වන ශ්රේණිය |
|---|---|---|---|---|---|
| සංඛ්‍යා සහ ගණනය කිරීම | ● 20 දක්වා සංඛ්‍යාව | ● 100 දක්වා සංඛ්‍යාව | ● 1,000 දක්වා සංඛ්‍යාව | ● 10,000 දක්වා සංඛ්‍යාව<br>● 10 දක්වා ඇති රෝම සංඛ්‍යා | ● 100,000 දක්වා සංඛ්‍යාව<br>● 20 දක්වා ඇති රෝම සංඛ්‍යා |
| | ● තනි ඉලක්කම් සංඛ්‍යා වල එකතු කිරීම/අඩු කිරීම (ඉහලට ගමන් කිරීම ආපසු පහලට නොකිරීම) | ● 20 දක්වා එකතු කිරීම/අඩු කිරීම (ඉහලට ගමන් කිරීම ආපසු පහලට කිරීම)<br>● ඉලක්කම් 2 සංඛ්‍යා එකතු කිරීම/අඩු කිරීම ලියා ගණනය කිරීම (ඉහලට ගමන් කිරීම ආපසු පහලට නොකිරීම) | ● ඉලක්කම් 2 සංඛ්‍යා එකතු කිරීම/අඩු කිරීම (ඉහලට ගමන් කිරීම ආපසු පහලට කිරීම)<br>● අනුනවය (පියවර 2, 5 සහ 10)<br>● අංශ ගණනය කිරීම් (2 භාජකයක් සහිත සංඛ්‍යා පමණි)<br>● ඉතිරි ඇති භාජකය | ● ඉලක්කම් 3 සහ 4 සංඛ්‍යා එකතු කිරීම<br>● ඉලක්කම් 3 සංඛ්‍යා අඩු කිරීම<br>● අනුනවය (පියවර 3-4)<br>● ගුණ කිරීම ලියා ගණනය කිරීම (දෙවන ස්ථාන අංකය) x (2-5, 10 අංකය)<br>● බෙදීම ලියා ගණනය කිරීම (2 සහ 3 වන ස්ථාන අංක) / (2-4 අංකය) | ● ඉලක්කම් 4 සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම<br>● අනුනවය (පියවර 6-9)<br>● ගුණ කිරීම (ඉලක්කම් 2 සහ 3 සංඛ්‍යා ගණන) x (2-10 සංඛ්‍යාව)<br>● බෙදීම (ඉලක්කම් 2 සහ 3 වන ස්ථාන ගණන) / (2-10 සංඛ්‍යාව) |
| | | | ● සරල භාගවල තේරුම (1/2 සහ 1/4) | ● භාග කියවීම සහ ලිවීම (1/2 සහ 1/4) | ● 1 ට වඩා අඩු කොටස් කියවීම සහ ලිවීම (හරය 4 සහ 10)<br>● දශම සංඛ්‍යා වල තේරුම (එක් දශම ස්ථානයක්) |
| හැඩ තලය | ● අවට ඇති තල රූප සහ ත්‍රිමාණාකාර රූප නිරීක්ෂණය කිරීම<br>● ද්‍රව්‍යන්ගේ පිහිටීම | ● සෘජුකෝණාස්රාකාර, හතරැස්, ත්රිකෝණ සහ කව වල ගුණ | ● දිශාව පිළිබඳ සංකල්පය (වම/දකුණ)<br>● සෘජුකෝණාස්‍ර, සණක, සිලින්ඩර, කේතු සහ ගෝල. | ● ලකුණු සහ රේඛා<br>● දිශාව පිළිබඳ සංකල්පය (නැගෙනහිර, බටහිර, දකුණ, උතුර)<br>● සමමිතික හැඩතල | ● සෘජු කෝණය<br>● ත්‍රිමාණ රූපයක මූලද්‍රව්‍ය (ශීර්ෂ, දාර, මුහුණු)<br>● වර්ධනය දර්ශනය |
| මානයන්/ වෙනස්කම් සහ සබඳතා | ● දිග සංසන්දනය<br>● බර සංසන්දනය<br>● තොග සංසන්දනය | ● දිග මැනීම (අර්ථ දක්වා ඇති ඒකක)<br>● බර මැනීම (අර්ථ දක්වා ඇති ඒකක)<br>● තොග මිනුම් (අර්ථ දක්වා ඇති ඒකක) | ● දිග ඒකකය (m)<br>● බර ඒකකය (kg)<br>● ප්‍රමාණ ඒකකය (L) | ● දිග ඒකකය (cm)<br>● බර ඒකකය (g)<br>● ප්‍රමාණ ඒකකය (mL) | ● දිග ඒකකය (km)<br>● දිග, බර, සහ ප්‍රමාණයන්ගේ වාක්‍යානු ගැටළු |
| | ● කාලය පිළිබඳ සංකල්පය (උදෑසන/ දහවල්, සවස) | ● දින දර්ශනය (සතියේ දින) | ● ඔරලෝසුව කියවන්නේ කෙසේද (පැය)<br>● දින දර්ශනය (දින, සති සහ මාස) | ● ඔරලෝසු කියවීම (විනාඩි 5 වර්ධක වලින්) | ● පැය 12 සහ පැය 24 පද්ධති<br>● ගත වූ කාලය |
| දත්ත භාවිතය | | ● හැඩය, වර්ණය සහ ප්රමාණය අනුව වස්තූන් වර්ගීකරණය | ● වගුව | ● තීරු ප්රස්ථාරය | ● කාල සටහන<br>● සංඛ්‍යාත බෙදාහැරීමේ වගු සහ තීරු ප්‍රමාණ |

*ශ්‍රී ලංකාවේ දරුවන් ප්‍රාථමික අධ්‍යාපනය ආරම්භ කරන්නේ වයස අවුරුදු පහේදීය, එය ජපානයට වඩා වසරකට පෙරය. ජපානයේ පළමු වසර සිසුන් සහ ශ්‍රී ලංකාවේ දෙවන වසරේ සිසුන් එකම වයසේ පසුවනවා.

### සංඛයා සහ ගණනය කිරීමේ දිසානතිය ඉගැන්වීමේදී සලකා බැලිය යුතු කරුණු

● <u>එක් එක් ශ්‍රේණියේ ඉගෙන ගන්නා වූ පූර්ණ සංඛ්‍යා</u>

ශ්‍රී ලංකාවේ සෑම ශ්‍රේණියකම අධ්‍යයනය කරන පූර්ණ සංඛ්‍යා ජපානයට වඩා සුළුතර වේ. උදාහරණයක් ලෙස, ජපන් තුන්වන ශ්‍රේණියේ සිසුන් මිලියන 100 ක් දක්වා ඉගෙන ගන්නා අතර, ශ්‍රී ලංකාවේ හතරවන ශ්‍රේණියේ (ජපානයේ තුන්වන ශ්‍රේණියේ සිටීමට තරම් වයසැති ළමුන්) ඉගෙන ගන්නේ 10,000 දක්වා පමණයි දක්වා පමණි. එබැවින්, පූර්ණ සංඛ්‍යා අධ්‍යයනය කිරීමට පෙර අමතර මග පෙන්වීමක් අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස ජපානයේ 4 ශ්‍රේණියේ සිට ඉගෙනුම ලබන දරුවන්ට ඉගෙනීමට පෙර 10,000 සිට මිලියන 100 දක්වා සංඛ්‍යා ඉගැන්විය යුතුය.

● <u>භාග ඉගෙන ගැනීම් සිදු කරන කාලය</u>

ජපානයේ ළමුන් 2 ශ්‍රේණියේ සිට භාග ඉගෙන ගන්නා අතර ශ්‍රී ලංකාවේ එය 4 ශ්‍රේණියේ දී (ජපානයේ 3 ශ්‍රේණියේ ළමුන්) ආරම්භ වේ. උදාහරණයක් ලෙස, ජපානයේ 3 ශ්‍රේණියේ සිට ඉගෙනුම ලබන දරුවන්ට භාගවල තේරුම සහ ඒවා කියවිය යුතු ආකාරය ඉගැන්විය යුතුය.

● <u>දශමයන් අධ්‍යයනය කළ යුතු කාලය</u>

ජපානයේ 3 ශ්‍රේණියේ සිට දශම ඉගැන්වෙන නමුත් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල්වල දශම ගණන ඉගෙන ගැනීමක් නොකරයි. උදාහරණයක් වශයෙන්, ජපානයේ 4 ශ්‍රේණියේ සිට ඉගෙනුම ලබන දරුවන්ට දශමවල තේරුම සහ කියවීම සහ සරල එකතු කිරීම සහ අඩු කිරීම ඉගැන්විම සිදු කල යුතුය.

©2024 Japan International Cooperation Agency. All Rights Reserved

# ශ්‍රී ලංකාවේ පාසල් සංස්කෘතිය

## වසර තුළ සිදු කරන පාඨශාලීය සිදු කිරීම්

ජනවාරි පෙබරවාරි මාර්තු අප්රේල් මැයි ජූනි ජූලි අගෝස්තු සැප්තැම්බර් ඔක්තෝබර් නොවැම්බර් දෙසැම්බර්

තුන පාසල් වාරය

- 1 වන අධ්‍යයන වාරය — නිවාඩුව (ආසන්න දින 10)
- 2 වන අධ්‍යයන වාරය — නිවාඩුව (ආසන්න දින 10)
- ★ ජාතික විභාග අ.පො.ස. උසස් පෙළ — නිවාඩුව (ආසන්න මාස 1)
- 3 වන අධ්‍යයන වාරය
- ★ අ.පො.ස.සාමන්‍ය පෙල — නිවාඩුව (ආසන්න මාස 1)

* 1 1 එය සති 10 සිට 12 දක්වා අධ්‍යයන වාරයක් සහිත අධ්‍යන වාර තුනකින් සමන්විත පද්ධතියකි.
* 2 ජනවාරි අග සහ අප්‍රේල් මැද (සිංහල දෙමළ අලුත් අවුරුද්ද) ආසන්න වශයෙන් දින 10 ක නිවාඩුවක් සහ අගෝස්තු සහ දෙසැම්බර් මාසවල ආසන්න වශයෙන් මාසයක නිවාඩුවක් ඇත.
*3 ප්‍රධාන වශයෙන් COVID-19 පැතිරීම හේතුවෙන් 2021 සහ 2022 දී අධ්‍යයන වාරයේ ආරම්භය ප්‍රමාද විය.

## දෛනික සිදුවීම

- පන්ති පැවැත් වීමසඳුදා සිට සිකුරාදා දක්වා වන අතර සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල වසා ඇත.
- ප්‍රාථමික පාසල්වල දිනකට අවම වශයෙන් පැය පහක් අධ්‍යයන කාලය (විවේක ආදිය ඇතුළුව) සහ කණිෂ්ඨ පාසල්වල දිනකට අවම වශයෙන් පැය හයක් සහිතව වසරකට පාසල් දින ගණන 210 කි.

ද්විතීය පාසල් උදාහරණය.

- 7:30 පාසල්ට පැමිණීම
- රැස්වීම/ශාරීරික අභ්‍යාස අධ්‍යාපනය/පුහුණු සැසි
- 7:50
- 8:00 අධ්‍යන පන්ති ආරම්භය
- 13:30 පාසැල අවසන් වීම

7:30-7:50
සතියකට වරක්, මිනිත්තු 20 ක සමස්ථ පාසැල් රැස්වීමක් පවත්වයි. අනෙක් දින හතර විනාඩි 20 ක ශාරීරික අභ්‍යාශ අධ්‍යාපන පන්ති දෙකකින්, චිත්ත ඒකග්‍රතා පුහුණු කිරීමේ සැසියක් සහ නායකත්ව පුහුණු සැසියකින් සමන්විත වේ.

8:00-13:30
- ඉගෙනුම පැය 1 ක් කාල පරිච්ඡේදය විනාඩි 60 (දිනකට විෂය පාඩම් 5)
- විවේක කාලය, මිනිත්තු 15 ක විවේක දෙකක් හෝ විනාඩි 30 ක විවේකයක් (පාසලේ අභිමතය පරිදි) වේ

බොහෝ සිසුන් පාසල් වෙත යන්නේ ගෙවීම් කරනු ලබන පාසල් බස්රථවලිනි. සමහර සිසුන් යතුරුපැදිවලින් හෝ පාපැදිවලින් පාසලට පැමිනෙණ අතර, ඔවුන්ගේ දෙමාපියන් විසින් රැගෙනෙ හැරලීමත් කරනු ලැබේ.

දිවා ආහාර විවේකයක් නොමැති අතර, උදේ 10:30 ට පමණ කෙටි ආහාර විවේකයක් ඇත.

නව විෂයමාලාව මඟින් ඉගැන්වීමේ කාල පරිච්ඡේදය එක් වරකට මිනිත්තු 40 සිට විනාඩි 60 දක්වා වැඩි කර ඇතත් බොහෝ පාසල් තවමත් එම වෙනස සිදු කර නොමැත.

## පාසල් ඇති නීති රීති සහ සිරිත් විරිත්

- පිරිමි ළමයි කෙටිව කොණ්ඩය කෙටිව කපා තිබිය යුතු අතර දිගු කෙස් ඇති ගැහැණු ළමයින් ඔවුන්ගේ හිස කෙස් ගොතා බැඳිය යුතු බවට නීතියක් තිබේ.
- අ.පො.ස. උසස්.පෙළ සමත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට හැකියාව ලැබන්නේ 6% පමණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පෞද්ගලික ගුරුවර සහ උපකාරක පන්ති ඉගැන්වීම් සඳහා ඇති ඉල්ලුම ඉහළ මට්ටමක පවතින අතර,පෞද්ගලික ගුරුවර සහ උපකාරක පන්ති ඉගැන්වීම් සඳහා වන මුදල් වියදම් කරන කුටුම්භවල අනුපාතය 64% වන අතර (2006-2007) (දමයන්ති, 2017) මෑත වසරවලදී තව තවත් එය වැඩිවෙමින් පවතී. පොහොසත් අය පමණක් නොව දුප්පතුන් පුද්ගලයන්ද දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වන ගෘහ වියදම ඉහළ ප්‍රතිශතයක් දරන බව සටහන් වී ඇත.

## පාසල් ජීවිතයට අවශ්‍ය දේ

- ප්‍රාථමිකයේ සිට උසස් පාසල දක්වා පෙළපොත් සහ නිල ඇඳුම් රෙදි නොමිලේ සපයනු ලැබේ. සටහන් පොත් සහ අනෙකුත් ලිපි උපකකරණ ද්‍රව්‍ය මිලදී ගත යුතුය.
- දිළිඳු ජන ප්‍රදේශවල ඇති පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සඳහා පාසල් දිවා ආහාරය සහ පාවහන් ලබා දීම, සහ දුප්පත් පවුල් සඳහා ශිෂ්‍යත්ව ඇතුළු ආධාර යෝජනා ක්‍රම තිබේ.

## බාහිර අධ්‍යයන ක්‍රියාකාරකම්

- සමහර කලාප සහ පාසල් ක්‍රීඩා දින, සංස්කෘතික උත්සව, පාසල් චාරිකා, විනෝද චාරිකා ආදිය සංවිධානය කරයි.

## දෙමාපියන්ගේ සහභාගීත්වය

- දෙමාපිය-ගුරු සම්මන්ත්‍රණ වසරකට තුන් වතාවක් පවත්වනු ලැබේ.
- පන්ති අධ්‍යාපන සහභාවි වීම් සහ නිවෙස්වෙත පැමිණීම සිදු නොකෙරේ.
- විදුයල් පති (සභාපති) උප විදුහල් පති සහ තේරී පත් වූ අධ්‍යන ගුරුවරුන්ගේ, දෙමාපියන්ගේ, ආදි සිසුන්ගේ සහ අධ්‍යාපන අධිකාරියේ නියෝජිතයන්ගෙන් සමන්විත (School Development Committee) පාසල් සංවර්ධන කමිටුවක් ඇත. කමිටු සාමාජිකයින්ගේ නිල කාලය වසර තුනක් වන අතර, වාර්ෂික ක්‍රියාන්විතයන් සැලසුම් කිරීම ආදිය සැකසීම සඳහා අවම වශයෙන් මසකට වරක් රැස්වීම් පවත්වනු ලැබේ.

### ඉගැන්වීම් මාර්ගෝපදේශයේ මතක තබා ගත යුතු කරුණු

- ශ්‍රී ලංකාවේ පවතින දරුණු විභාග තරඟය නිසා බොහෝ දරුවන් පාසලෙන් පසු කාලය ගත කරන්නේ අතිරේක උපකාරක පන්ති පාසල්වල හෝ පෞද්ගලික ගුරුවරුන්ගෙන් ඉගෙනුම ලබමිනි. පාසල් වේලාවෙන් පසු, ගුරුවරුන් ගාස්තුවක් ගෙවා උපකාරක පන්ති පැවැත්වීම අමුතු දෙයක් නොවේ. පුද්ගලික උපකාරක පන්ති ආදිය සඳහා දෙමාපියන්ගෙන් හෝ භාරකරුවෙකුගෙන් ඉල්ලීමක් ලැබුණහොත් ජපානයේ එවැනි පුරුද්දක් නොමැති බව මනාව පැහැදිලි කළ යුතුය.

©2024 Japan International Cooperation Agency. All Rights Reserved